# පොලිස් මාධ්‍ය කොට්ඨාසය

# பொலிஸ் ஊடகப் பிரிவு

# POLICE MEDIA DIVISION

14 වන මහල,සුහුරුපාය,බත්තරමුල්ල

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| දිනය Date | 2025.05.18 පැය 2345 | දුරකථන අංකය Tel.NO | 011-2887973 | මගේ අංකය My NO | D/Media/Out/1017 /2025 | විද්‍යුත් ලිපිනය E-Mails | dir.media@police.gov.lk |


**<u>පොලිස් මාධ්‍ය කොට්ඨාසය වෙත වාතර්ා වූ වැදගත් තොරතුරු</u>**

## 01. වෙඩිතබා තුවාල සිදුකිරිමක් - කොටහේන පොලිස් වසම.

2025.05.18 වන අද දින සවස් කාලයේ කොටහේන පොලිස් වසමේ සිරිසඳ සෙවණ මහල් නිවාස සංකීණර්ය ආසන්නයේ වෙළඳසැලක් ඉදිරිපිට රැදී සිටි පුද්ගලකුට යතුරු පැදියකින් පැමිණි නාඳුනන පුද්ගලයින් දෙදෙනෙකු විසින් වෙඩි තබා පලාගොස් ඇත. වෙඩි වැදීමෙන් එම පුද්ගලයා තුවාල ලබා කොළඹ ජාතික රෝහලට ඇතුළත් කර ඇත.

**තුවාලකරු වයස අවුරුදු 41 ක් වන කොළඹ 13 ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

මෙම වෙඩි තැබිම සඳහා පිස්තෝල අවියක් යොදාගෙන ඇති අතර, වෙඩි තැබීමට හේතුව මෙතෙක් අනාවරණය වී නොමැත. වෙඩික්කරුවන් පැමිණි බවට සැක කෙරෙන යතුරු පැදිය ග්‍රෑන්ඩ්පාස් පොලිස් වසමේ අතහැර දමා ගොස් තිබියදී පොලිසිය විසින් සොයාගෙන ඇත.අපරාධයට සම්බන්ධ සැකකරුවන් අත්අඩංගුවට ගැනීම සඳහා කොටහේන පොලීසිය වැඩිදුර විමශර්න සිදු කරනු ලබයි.

## 02. පිස්තෝල අවියක් සමඟ සැකකරුවන් දෙදෙනෙකු අත්අඩංගුවට - යටවත්ත පොලිස් ස්ථානය.

2025.05.18 වන අද දින උදෑසන කාලයේ යටවත්ත පොලිස් වසමේ ලෝඩන් හන්දිය ප්‍රදේශයේදී යටවත්ත පොලිස් ස්ථානයේ නිලධාරීන් කණ්ඩායමක් විසින් සිදුකළ රථවාහන පරීක්ෂාවකදි ජීප් රථයක් නවතා පරීක්ෂා කිරීමේදී එම රථයේ සඟවා තිබූ විදෙස් රටක නිෂ්පාදිත මිලිමීටර් 09 වගර්යේ පිස්තෝල අවියක් සොයාගෙන ඇති අතර එම රථයේ සිටි පුද්ගලයින් දෙදෙනෙකු ගිනි අවිය හා ජීප් රථය සමඟ අත්අඩංගුවට ගෙන ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරුවන් අවුරුදු 39 හා 44 වයස්වල පසුවන නාරම්මල හා කුරුණෑගල ප්‍රදේශවල පදිංචිකරුවන් වේ.**

යටවත්ත පොලිසිය වැඩිදුර විමශර්න සිදු කරනු ලබයි.

## 03. මෙරට නිෂ්පාදිත ගිනි අවියක් සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - පනාමුර පොලිස් ස්ථානය.

2025.05.18 වන අද දින දහවල් කාලයේ පනාමුර පොලිස් වසමේ නුංගහයාය ප්‍රදේශයේදී පනාමුර පොලිස් ස්ථානයේ නිලධාරීන් කණ්ඩායමක් විසින් ලද තොරතුරක් මත වැටලීමක් සිදුකර **මෙරට නිෂ්පාදිත බඳින තුවක්කුවක් සන්තකයේ තබා ගෙන සිටි සැකකරුවෙකු** අත්අඩංගුවට ගෙන ඇත.

**සැකකරු වයස අවුරුදු 46 ක් වන නුංගහයාය, ගොඩවෙල ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

පනාමුර පොලිසිය වැඩිදුර විමශර්න සිදු කරනු ලබයි.

## 04. මෙරට නිෂ්පාදිත ගිනි අවියක් සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - සමනලවැව පොලිස් ස්ථානය.

2025.05.18 වන අද දින දහවල් කාලයේ සමනලවැව පොලිස් වසමේ බුලත්ගම ප්‍රදේශයේදී සමනලවැව පොලිස් ස්ථානයේ නිලධාරීන් කණ්ඩායමක් විසින් ලද තොරතුරක් මත වැටලීමක් සිදුකර **මෙරට නිෂ්පාදිත ගිනි අවියක් සන්තකයේ තබා ගෙන සිටි සැකකරුවෙකු** අත්අඩංගුවට ගෙන ඇත.

**සැකකරු වයස අවුරුදු 51 ක් වන බුලත්ගම,බලංගොඩ ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

සමනලවැව පොලිසිය වැඩිදුර විමශර්න සිදු කරනු ලබයි.

## 05. මෙරට නිෂ්පාදිත ගිනි අවියක් සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - පරයනාලන්කුලම් පොලිස් ස්ථානය.

2025.05.18 වන අද දින දහවල් කාලයේ පරයනාලන්කුලම් පොලිස් වසමේ නීලියාමොටේ ප්‍රදේශයේදී පරයනාලන්කුලම් පොලිස් ස්ථානයේ නිලධාරීන් කණ්ඩායමක් විසින් ලද තොරතුරක් මත වැටලීමක් සිදුකර **මෙරට නිෂ්පාදිත ගිනි අවියක් සන්තකයේ තබා ගෙන සිටි සැකකරුවෙකු** අත්අඩංගුවට ගෙන ඇත.

**සැකකරු වයස අවුරුදු 27 ක් වන පුවරසම්කුලම් ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

පරයනාලන්කුලම් පොලිසිය වැඩිදුර විමශර්න සිදු කරනු ලබයි.

## 06. හෙරොයින් සමඟ සැකකාරියක් අත්අඩංගුවට - ග්‍රෑන්ඩ්පාස් පොලිස් ස්ථානය.

2025.05.18 වන අද දින දහවල් කාලයේ ග්‍රෑන්ඩ්පාස් පොලිස් වසමේ ඔරුගොඩවත්ත ප්‍රදේශයේදී ග්‍රෑන්ඩ්පාස් පොලිස් ස්ථානයේ නිලධාරීන් කණ්ඩායමක් විසින් ලද තොරතුරක් මත වැටලීමක් සිදු කර හෙරොයින් ග්‍රෑම් 18 මිලිග්‍රෑම් 303 ක් සන්තකයේ තබාගෙන සිටි සැකකාරියක් අත්අඩංගුවට ගෙන ඇත.

**සැකකාරිය වයස අවුරුදු 30 ක් වන කොළඹ 10 ප්‍රදේශයේ පදිංචිකාරියකි.**

ග්‍රෑන්ඩ්පාස් පොලිසිය වැඩිදුර විමශර්න සිදු කරනු ලබයි

## 07. හෙරොයින් සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - පැලියගොඩ පොලිස් ස්ථානය.

2025.05.18 වන අද දින දහවල් කාලයේ පැලියගොඩ පොලිස් වසමේ 05 කණුව ප්‍රදේශයේදී පැලියගොඩ පොලිස් ස්ථානයේ නිලධාරීන් කණ්ඩායමක් විසින් ලද තොරතුරක් මත වැටලීමක් සිදු කර හෙරොයින් ග්‍රෑම් 05 මිලිග්‍රෑම් 800 ක් සන්තකයේ තබාගෙන සිටි සැකකරුවෙකු අත්අඩංගුවට ගෙන ඇත.

**සැකකරු වයස අවුරුදු 47 ක් වන කැලණිය ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

පැලියගොඩ පොලිසිය වැඩිදුර විමශර්න සිදු කරනු ලබයි

**පොලිස් මාධ්‍ය කොට්ඨාසය.**